## ස්ටෝම් - අපි සූදානම්ද?

ස්ටෝම් එකක් හෙවත් කුණාටුවක් කිව්වම අපට මැවෙන්නෙ දරුණු සුළඟකුත් එක්ක මහා විනාශයක දසුනක්. ඒ නිසා ස්ටෝම් කියන වචනෙම තියෙනවා පොඩි තිගැස්සෙන ගතියක්. ලංකාවේ අපට නම් ඔය ෂටෝම් වල හොඳම අත්දැකීම 82 සුළි සුළඟ තමයි. විනාශය ගැන කියනවා නම් සුනාමිය තමයි.

ඒත් මෙදා පාර ඔස්ට්‍රේලියාවෙ වික්ටෝරියාවෙ අයට ස්ටෝම් එක ගෙනාවෙ වෙනත්ම ආකාරයක ව්‍යසනයක්. දේපොළ ගහ කොළ විනාශ කරනවා වෙනුවට මෙදා පාර ස්ටෝම් එක බිලි ගත්තෙ මිනිසු. ඒ බිලි ගැනීමත් වෙනස්ම ආකාරයේ එකක්. ලෝකයේම පළමු වතාවට ස්ටෝ ම් එකකින් ආව ආසාදනයකින් මිනිසුන් අටක් මිය යාම මේ ලෝකයට මොනවා වෙමින් තිබෙනවාද කියන ප්‍රශ්නය නැවත නැතව අපේ හිතේ ඇති කරනවා.

කරුමේ කියන්නෙ මොකක් හරි හොඳක් හරි නරකක් හරි වෙනකොට අපේ රටේ කෙනෙකුත් ඈඳෙන එකයි. ජීවිතේ කිසිම දාක හේ ෆීවර් ඇස්මා නොහැදුන අයටත් එකපාරටම හුස්ම ගන්න අමාරු වෙලා මරණය වැළඳගන්න සිදුවීම හරිම අවාසනාවන්ත සහ කණගාටුදායක දෙයක්. ඒ ගැන චූටි මල්ලිගෙ හිතේ තියෙන කණගාටුව වචන වලින් ලියන්න බැහැ.

මිනිස්සු හිතන්නෙ නැති වුණාට ලෝකයේ පාරිසරික චලන සහ වෙනස්වීම් මිනිස් ජීවිත වලට කොයි තරම් බලපෑම් කරනවාද කියන කාරණය නැවත වතාවක් හිතන්න කාලය ඇවිල්ලා. ලෝකයේ කොයි තරම්



දියුණු රටක් වුණත් මේ වගේ ක්ෂණික ව්‍යවසන වලට මුහුණ දෙන්න කාටවත් තවම හැකියාවක් තියෙනවද? අවම වශයෙන් අවශ්‍ය කරන බෙහෙත් හේත් ස්ටොක් එකක් වත් පවත්වාගෙන යන්න මේ අයට හැකි වෙලා තියෙනවද?

ඉදිරියෙදි ඇති වෙන්න ඉඩ තියෙන මෙවැනි පාරිසරික ව්‍යවසන ගැන අපි වඩාත් කල්පනාකාරීව හිටියොත් හොඳයි. මොකද දැනටමත් අපට අපේ හිතවතෙක් අහිමි වෙලා තියෙන නිසා.

## සුනාමිය - නැවත සිහිපත් කිරීමක්

ස්ටෝම් ගැන කියනකොට සුනාමියත් මතක් වුණා. මේ දෙසැම්බර් මාසෙදි සුනාමිය කොහොම අමතක කරන්නද? ඒත් ඉතින් අපේ රටේ බොහෝ දෙනාට මතක තියෙන්නෙ සුනාමියක් ආවා කියලා විතරයි වගේ. ඉදිරියෙදි ඇති වෙන්නට ඉඩ තියෙන මෙවැනි ව්‍යවසන වලට මුහුණ දෙන්නට ඇති කරගත්



එකගතා සහ නීති රීති ගැන වගේ වගක් වත් දැන් මිනිසුන්ට තියේද? කෝ අර වෙරළ ආසන්නයේ ගොඩනැගිලි ඉදිකිරීම් වලට පැනවුණ නීති? සුනාමි වැඩ පිළිවෙලවල්? අවතැන් වූවන් සඳහා වූ සහන සේවා? ඒ සියල්ලම යට ගිහින්. වෙන එකක් තියා දේශපාලකයන් ගසා කාපු සුනාමි සල්ලි ගැනවත් කාටවත් දැන් මතකයක් නෑ වගේ. හෙල්පින් හම්බන්තොට..



නිකමට හිතමු තවත් එවැනි සුනාමියක් ආවොත් ඇති විය හැකි තත්වය කෙසේ වෙයිද කියා. මේවා ගැන පාලකයන්ට විතරක් නෙවෙයි ජනතාවටත් වගේ වගක් නැහැ. මේක නම් මාරම රටක් තමයි. දුක්වෙලා වැඩක් නැහැ . ජනතාවගේ හැටියට පාලකයන් ලැබෙන්නා වගේම පාලකයන්ටම හරියන ජනතාවක් තමයි ඉන්නෙ. චූටි මල්ලි නම් කරන්නෙ එක ප්‍රාර්ථනාවයි. සුනාමියක් එනවා නම් ඇහැ කන පේන වෙලාවක එන්න කියන එකයි. එහෙම වුණොත් අඩු ගානේ උස තැනකටවත් දුවගන්න ඉඩක් ලැබෙනවා. මේව හිතනකොට කඳුළු උනන්නෙ තනි ඇහැට සට සට ගාලා. අහ්.. ඕක මොකක්ද..? මිනී මරන්න අවසර ඉල්ලලා පෙලපාලි යන රටක් නෙ මේක...

## කස්ත්‍රෝ

කස්ත්‍රෝ මිය ගියා. ඔහු ජීවත්ව සිටින කාලය තුළ නම් මම හිතුවෙ ඔහුගේ මිය යාම කෙදිනක හෝ ලෝකයම - විශේෂයෙන් ලංකාවම - කම්පාවට පත්වෙන දෙයක් වෙවි කියලා. එහෙත් මට දැනුන විදිහට නම් අපේ රටේ ඔහුගේ වියෝව එතරම් දැනුන පරම්පරාවක් නැහැ වගේ. වාමාංශික ලෝකය තුළත් චේ සැමරීමට දරන උත්සාහයවත් කස්ත්‍රෝ සමුගැනීම සඳහා යෙදවුණාද කියන සැකයක් මට ඇතිවුණේ.



ඔහුගේ වියෝවෙන් පසු අන්තර්ජාලය හරහා පැතිරුණ ගොසිප් දෙස බැලීමේදී ඇතිවුණේ හාස්‍යයක් වගේම පිලිකුලක්. මිනිස්සු හැමවිටම සත්‍යය අමතක කොට බොරුව රජ කරවීමටත් පිළිගැනීමටත් කැමතියි. එසේ කිරීම ඉතා පහසුයි. සත්‍යයට හා කටුක යථාර්ථයට මුහුණ දීම අපහසුයි. සමහර මිනිස්සු කස්ත්‍රෝට බනින්නෙ ඇයි? ඇමරිකන් කාරයගෙ නිවාඩු නිකේතනයක් වෙලා තිබ්බ කියුබාව ලෝක සිතියමේ දෙපයින් නැගිටුවා තියන්න ඔහු තමන්ගෙ රට වෙනුවෙන් කරන ලද සේවාව අමතක කරන්නෙ ඇයි? මේ ලෝකයේ ජීවත් වීම සඳහා මානව නිදහස පමණක් තිබුණොත් ඇත්ද?

මානව නිදහස මූලික අවශ්‍යතාවක් තමයි. ඒත් රටක ඉදිරි ගමනකදි ගන්නාවූ තීරණ උදෙසා එහි යම් යම් සීමාවන් පැනවීමට සිදුවන බව අපේ ඇස් ඉදිරිපිටම ලෝකය පුරාම කොතරම් උදාහරණ තියෙනවද?

නිකමට සරළම උදාහරණයක් ගනිමු. පසුගිය ආණ්ඩුව විසින් ඇති කරන ලද තාඩන පීඩන ක්‍රියා කලාප නිසා ජනතාව ඔවුන් ඉවත් කළානෙ. ඉන් පස්සෙ දැන් තියෙන බහපාලන ආණ්ඩුව ආවනෙ. ඇවිත් පෙර නොතිබූ නිදහසක් ජනතාවට ලැබීමෙන් පසු ඒ නිදහසේ නාමයෙන් විරුද්ධ පක්ෂ කරන විවිධාකාර හානිදායක ක්‍රියා වලට ජනතාව බනින්නෙ ආන්ඩුවටනෙ. "පණ නැති ආන්ඩුවක්" කියලනෙ. ඊටත් ඉදිරියට ගිහිල්ලා කියන්නෙ "ඔන්න ගෝඨා හරි මහින්ද මහත්තයා හරි හිටිය නං කවුරුත් මීක් ගාන්නෙ නැහැ" කියලනේ. දැන් ඉතින් කොයි ක්‍රමේද ගැළපෙන්නෙ?

බහුතරයකගෙ සුවසෙත පිණිස තීන්දු තීරණ ගැනීමෙදි විරෝධතාවන් මර්ධනය පාලනය කිරීමට සිදුවීම අනිවාර්ය දෙයක්. මේක මෙහෙම කතා කරන්න පුලුවන් මාතෘකාවක් නොවුණත් ඉතා කෙටියෙන් මේ ටික කිව්වෙ .

අපි නැවතත් කස්ත්‍රෝ සහෝදරයා ගැන ගත්තොත් ඔහු දරුණු පාලකයෙක් ඒකාධිපතියෙක් කියන මිනිස්සු අමතක කරන කාරණය තමයි ඔහුට එවැනි තත්වයට පත්වෙන්න සිදු වුණ හේතු සාධක මොනවාද කියන එක. ආණ්ඩුවක් පිහිටවපු දවසේ ඉඳලා නොනවත්වාම අඩ සිය වසකට අධික කාලයක් දැඩි ආර්ථික සම්බාධක පැනවීම් වලට මුහුණ දෙමින් ඒ හා සමානවම රජය පෙරළීමේ කුමන්ත්‍රණ ආක්‍රමණ 600කට අධික ප්‍රමාණයකට මුහුණ දෙමින් රටක් ඉදිරියට ගෙනියන්න නම් ඒ පාලකයාට අයෝමය හස්තයක් තිබිය යුතුමයි. ඔහුගෙ කාලය තුළ ලෝකයේ හොඳම සෞඛ්‍ය සේවාව හා අධ්‍යාපන පහසුකම් රටේ ජනතාවට ලබාදීමම ප්‍රමාණවත් නැතිද?

මෑතක් වන තුරුම අපි ඇහුවේ බටහිර මාධ්‍ය විසින් කස්ත්‍රෝ හා කියුබාව සම්බන්ධයෙන් ප්‍රචාරය කරන ලද සාවද්‍ය තොරතුරු පමණයි. ඒත් පසුගිය කාලයේ ලෝකයේ විවිධ ජාතීන්ට කියුබාව තුළ සංචාරය කිරීමට අවසර ලැබීමෙන් පසු සැබෑ තතු දැනගැනීමට අපටත් අවස්ථාව ලැබුණා. චූටි මල්ලිගේ ධනපති මාමා කෙනකු කියුබාවේ පසුගිය කාලයේ ජීවත් වුණා. සංවර්ධන කටයුත්තකට ගිහින්. යනකොට ගියේ පට්ට ධනපතියෙක් විදිහට. එනකොට ආවෙ මාර මධ්‍යස්ථ මිනිහෙක් විදිහට. ඒ අහපු කතන්දර ටිකම ඇති මට නම්. ඕනෙ කෙනෙකුට ඕනෙ අදහසක් දරන්න පුලුවන්. තම තමන්ගේ මොලේ ප්‍රමාණය හැටියට. ඒත් අප සත්‍යය අවබෝධ කරගත යුතුමයි. කස්ත්‍රෝ සටන ආරම්භ කළ අවධිය තුළ ලෝක තත්වයත් ඊට මුහුණ දුන් ආකාරයත් ඔවුන්ගේ ඒ කැපවීම අධිෂ්ඨානය ලෝක වාමාංශික ව්‍යාපාරයට ඇති කළ බලපෑමත් මේ ලොව තවත් බොහෝ කාලයක් පවතීවි.

## ගිලන් රථ ගැන කතාබහක්

ගිලන් රථ සේවාව ගැන ලියන්න හිතුණේ කාරණා කීපයක් හිතට ආපු නිසා. ලංකාවෙදි නම් ඉතින් ගිලන් රථයක යන්න නම් මැරෙන සයිස් එකේ ලෙඩක් හැදෙන්නම ඕනෙ. ඒකටත් ඉතින් ඉස්පිරිතාලෙකම ඉන්නත් ඕනෙනෙ. දැන් නම් මේ ඉන්දියාවෙන් ගෙනැල්ල පටන් ගත්ත සේවාව නිසා ඉසසරට වඩා පහසුකමක් ගෙදර ඉඳලම ලබා ගන්න හැකියාව ලැබිල තියෙනවා. අපට සතුටුයි ඒකට. ඉතින් එහෙම රටක ඉඳලා ඇවිත් මෙහෙදි පොඩි අමාරුවකට උනත් ගිලන් රථයකට සෙට් වෙන්න උත්සාහ




දරන්නේ හේතු කීපයක් නිසානෙ. ප්‍රධාන කාරණේ මෙහෙදි බොහෝ වේලාවට ගිලන් රථයක ගිහින් ඇතුල් වුණොත් ලැබෙන ප්‍රමුඛත්වය. අනෙක රෝහලට ඇතුල් කරන තෙක් ලැබෙන සුරක්ෂිතබව. අනෙක් කාරණේ නම් ඉතින් අපි පවුල් පිටින්ම ඇම්බියුලන්ස් කවර් එක දාගෙන ඉන්න නිසා අවුරුද්දටම සල්ලිත් ගෙවන එකේ ඒකෙනුත් වැඩක් ගත්තම මොකද වෙන්නෙ කියන සිතුවිල්ල.

බලාගෙන ගියාම මේ කාරණා වල ඇති වරදකුත් පේන්නෙ නැහැ. ඒත් හිතල බැලුවොත් පොඩි අවුලකුත් තියෙනව වගේ නේ? ඒත් මං ටිකක් පොදු පොඩි අත්දැකීමක් කියන්නම්. දැන් මේක බොහෝ දෙනා අත්හදා බලමින් ඉන්න දෙයක්. මේ ළඟදි අපි දන්න කෙනෙක් හොස්පිට්ල් ගියා අමාරුවකට හදිසි සේවා අංශයට. ඒ කියන්නෙ එමර්ජන්සි එකට. කිසිම සැළකිල්ලක් ලැබුණෙ නැහැ. බැරිම තැන ආවා ගෙදරට. ගත්ත කෝල් එකක් ඇම්බියුලන්ස් එකට. විනාඩි ගණනනික් ගිලන් රථය ගෙදර. දාගත්තා ලෙඩාව ගියා හොස්පිට්ල් එකට. කෙළින්ම ඇතුළෙ. මල් හතයි. ගෙදර ඇවිල්ලා පොඩි කයිවාරුවකුත් ගහනවා.

තමන්ගේ වැඩේ කොහොම හරි කරගන්න ඕනෙ තමයි. මුදලුත් ගෙවල තමයි තියෙන්නෙ. ඒත් මේ වැඩේ පොඩි අවුල් ගතියක් තියෙනවා නේද? ඒකෙම අනිත් පැත්ත තමයි තමන්ට රෝහලට යන්න හැකියාව තියෙද්දි ගිලන් රථයේම යන්න උත්සාහ දැරීම. ඒක ටිකක් රිස්කි වැඩක් ලොක්කා. ලැබෙන ප්‍රතිඵලය නරක වෙන්න තියෙන ඉඩ කඩ බොහොම වැඩියි. ලෙඩාගේ අවට ඉන්න කට්ටිය තමයි ඒ ගැන හිතන්න ඕනෙ. තමන්ට පහසුකමක් තියේ නම් සේවාව එනකල් නොසිට ඉන්මණින් රෝහලට ගෙනියන එක තමයි කළ යුතුම දේ.

අපි කොහොමත් නිකං දෙන්න කැමති කේට්ටිය නෙවෙයිනෙ. දුන්න වෙනුවට මොකාාාක් හරි ලබා ගන්න හරිිිිිි කැමතියි. හැබැයි ඉතින් ඒ සිතුවිල්ලෙන් අපටම වරදින වෙලාවකුත් එනවා කියන එකත් මතක තියාගන්න ඕනෙ.

චූටි මල්ලි